## 448 සොඳුරු පැයක

සොඳුරු පැයක අඳුරු රැයක
ජේසු උපන්නේ
අඳුරු රැයක සොඳුරු ලියක
මුහුණ දිලෙන්නේ
මලුත් පරවෙලා දළුත් පරවෙලා
සුවඳ ලාටු දැල්වී වළලු දුම් ඇදේ

රත් තලා වළලු ලා
අතට බිළිඳුගේ
සුවඳ ලා ඇඟ උලා
බිළිඳු ජේසුගේ
අතට ගෙන වඩා කරට ගෙන වඩා
සිඟිති අත් බදාලා නෙළමු මල් වගේ

රතින් මුදු සදාලා
ඇඟිල්ලට දමා
පබළු වැල් ගොතාලා
ඉන වටේ දමා
පියලි පොඳි ඔබා තොටිල්ලක දමා
කුරුඳු කොළ කඩාලා සුවඳ ගන්වමු